# පටිච්චසමුප්පාදය තුළින් අර්ථවත්වන මාධ්‍යමික දර්ශනය

කරපික්කඩ සෝභිත හිමි

**"යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තාථාගතෝ ආහ**
**තේසංච නිරෝධෝ - ඒවං වාදි මහා සමනෝ"[1]**

බුදු දහම යනු පටිච්චසමුප්පාදයයි. පටිච්චසමුප්පාදය යනු බුදු දහමයි. මෙම කරුණු දෙක කිසි ලෙසකින් වත් වෙන් කළ නොහැකිය. ඉහත සූත්‍ර පාඨය අනුව බුදු දහමෙහි සාරය වන පටිච්චසමුප්පාද දේශනාව ඉතා කෙටියෙන් දැක ගත හැකිය. අස්සජි හිමියන් විසින් උපතිස්ස පිරිවැජියා වෙත දේශනා කළ දහම් පාඨය මෙයයි. 'යමක හට ගැනීමක් වේද එම හටගැනීමේ හේතුව බුදුරජාණන් වහන්සේ දේශනා කරන බවත්, එහි නිරෝධය දේශනා කරන බවත් මෙහි සරල අර්ථයයි. ඒ අනුව බුදුරජාණන් වහන්සේ හේතුඵලවාදීව හෙවත් පටිච්චසමුප්පාදව දහම් දේශනා කරන බවත් මුල් සූත්‍ර වල නිතර දක්නට ලැබෙන කරුණකි. මුල් බුදුසමය ප්‍රාග් බෞද්ධ භාරතීය දර්ශන වලින් වෙන් වන ප්‍රධානතම කරුණක් වනුයේ පටිච්චසමුප්පාද දේශනාවයි.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අනතුරුව බෝමැඩ දෙසතියක් වැඩ වසමින් පටිච්චසමුප්පාද දේශනාව අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළ ආකාරය පිළිබඳ මජ්ඣිම නිකාය අරියපරියේසන සූත්‍රයේ දේශනා කොට තිබේ.

**"තස්ස මයිහං භික්ඛවේ එතදහෝසි අධිගතෝ බෝම්‍යායං ධම්මෝ ගම්භීරෝ දුද්දසෝ දුරාණුබෝධෝ සන්තෝ පනීතෝ අතක්කාවචරෝ නිපුණෝ පණ්ඩිතවේදනීයෝ ආලය රාමා බෝ පනායං පජා ආලයරතා ආලය සමුදිතා ආලය රාමා බෝ පන පජාය ආලයරතාය ආලය සමුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදිප්පච්චයතා පටිච්චසමුප්පාදෝ "[2]**

"බුදුරජාණන් වහන්සේ බෝමැඩ වැඩ වාසය කරන අවස්ථාවේ උන්වහන්සේට මෙසේ සිත් විය. මා විසින් අවබෝධ කරගන්නා ලද මේ ධර්මය ගැඹුරුය. දක්නට අවබෝධයට නොපහසුය, ශාන්තය, ප්‍රනීතය, තර්කයෙන් බැස ගත නොහෙන්නේය, නිපුනය, පණ්ඩිතයන්

විසින් දත යුතුය. පංචකාමයෙහි ඇලී සිටින මේ ජනයා හට යම් පටිච්චසමුප්පාදයක් වේද, මේ කාරණය දක්නට නොපහසුය". ඒ අනුව බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි පටිච්චසමුප්පාදය සාමාන්‍ය පුද්ගලයන්ට අවබෝධ කළ නොහැකි දහමක් වශයෙන් දේශනා කොට තිබේ.

දිනක් ආනන්ද හිමියන් බුදුරජාණන් වහන්සේ ඉදිරියේ ප්‍රකාශ කරනු ලබන්නේ තමන් වහන්සේට පටිච්චසමුප්පාද දේශනාව ඉතා සරල දේශනාවක් වශයෙන් වැටහෙන බවයි. ඒ බව සංයුක්ත නිකයේ නිධාන සූත්‍රයේ කරුණු ඉදිරිපත් කොට තිබේ. එහිදී බුදුරජාණන් වහන්සේ විසින් එයට පිළිතුරු ලබා දෙමින් මෙසේ වදාළහ.

**''මා හේවං ආනන්ද මා හේවං ආනන්ද ගම්භීරෝ චායං ආනන්ද පටිචපමුප්පාදෝ ගම්භීරාවභාසෝ ච ඒතස්ස ආනන්ද ධම්මස්ස අඤ්ඤාණ අනනුබෝධා අප්පටිවේදා එවං මයං පජා තණ්හා කුලක ජාතා ගුලාගුණ්ඨික ජාතා මුඤ්ජ පබ්බජා භූතා අපායං දුක්ඛ ගතිං පථීපාතං සංසාරං නා තිවත්තෙන්ති''**[3]

"ආනන්ද එසේ නොකියන්න මේ පටිච්චසප්පුප්පාද දේශනාව ඉතා ගැඹුරුය. ගැඹුරු වුයේ ගැඹුරු බව පෙනේ මේ දහම අවබෝධ නොකිරීම නිසා සත්වයෝ අවුල් වූ නූල් පන්දුවක් සේ විය. එහෙයින් දුක් සහිත වූ මේ සසර අවබෝධ නොකරත්." ඒ අනුව බුදුරජාණන් වහන්සේ දේශනා කළ පටිච්චසමුප්පාදය ඉතා ගැඹුරු දාර්ශනික අර්ථයක් ඉස්මතු කරන දේශනාවක් වශයෙන් සඳහන් කළ හැකිය.

බුදු දහමේ ඉදිරිපත් කොට තිබෙන මෙම ගැඹුරු වූ පටිච්චසමුප්පාද දේශනාව හීනයාන, මහායාන යන නිකාය දෙකෙහි එක සේ පිළිගන්නා අතර, විවිධ නිකායන් බිහිවීම කෙරෙහිද මේ දහම හේතු වූ බව දක්නට ලැබේ. බෞද්ධ අංශයෙන් බලන කළ පටිච්චසමුප්පාද දේශනාවට හේතු වූයේ දුක පිළිබඳ විවරණය කිරීමයි. තත් කාලීනව ආගම් වල පැවැති හේතු-ඵල ධර්මතාව සම්බන්ධ ඉගැන්වීම් චතුෂ්කෝටි ක්‍රමයට විවරණය කොට ඒවා ප්‍රතික්ෂේප කළ ආකාරය සංයුක්ත නිකායේ අචේලකස්සප සූත්‍රයේ මේ බව දක්නට ලැබේ. අචේලකස්සප අසන හැම පැනයකටම පිළිතුරු දෙන බුදුරජානණ් වහන්සේ ඔහුගේ සියලුම මතයන් ප්‍රතික්ෂේප කොට දුක යන්න පටිච්චසමුප්පන්න බව ප්‍රකාශ කරති. ඒ අනුව අචේලකස්සප



හට අනුලෝම ප්‍රතිලෝම වශයෙන් පවත්නා ප්‍රතීත්‍ය සමුප්පන්නය බුදුන් වහන්සේ දේශනා කළ ආකාරය දක්නට ලැබේ.

බුද්ධ දේශිත හැම ධර්මයකම ප්‍රතිෂ්ඨාව ප්‍රතීත්‍ය සමුප්පාදයයි. සත්වයාගේ දුක්ඛ ප්‍රභවයත් දුක්ඛ නිරෝධයත් පටිච්චසමුප්පාදය පදනම් කර ගෙන ප්‍රවෘත්ත වේ. ප්‍රවෘත්තිය අනුසෝතගාමී වශයෙනුත් නිවෘත්තය පටිසෝතගාමී වශයෙනුත් දේශනා කළහ. සියලු සංස්කාර ධර්මයන්ගේ යථා ස්වභාවය යන්න විවරණය කරනු ලබන එකම ධර්මය ප්‍රතීත්‍ය සමුප්පන්න දහමයි. අනිත්‍යාදී සියලුම ධර්මයෝ හේතුප්ප්‍රත්‍යව හටගනෙ හේතුප්‍රත්‍යව නිවෘතියට පත් වෙති. නිබඳවම ඉපදීම නැසීම ප්‍රතීත්‍ය සමුප්පන්නව සිදු වන ආකාරය සංයුක්ත නිකායේ සඳහන් වී තිබේ.

පටිච්චසමුප්පාද දේශනාව බුදු සමයේ මූලිකම දේශනාවයි. ඒ අනුව පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳ ත්‍රිපිටක සූත්‍ර දේශනා රාශියක කරුණු ඉදිරිපත් වී තිබේ. මූලික වශයෙන් පටිච්චසමුප්පාද දේශනාවහි අංක දොළොසක් වශයෙන් ඉදිරිපත් කරයි.

**''ඉති බෝ භික්ඛවේ අවිජ්ජා පච්චයා සංකාරා, සංකාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණං පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනං, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනන්සු පායාසා සම්භවන්ති ඒවමේතස්ස කේවලස්ස දුක්ඛකඛන්ධස්ස සමුදයෝ හෝති''**[4]

අවිද්‍යාව හෙවත් නොදැනීම ප්‍රත්‍ය කොට ගෙන සංස්කාරයන් ද, සංස්කාර ප්‍රත්‍ය කොට ගෙන විඤ්ඤාණය ද ආදී වශයෙන් එකිනෙක ප්‍රත්‍ය කොට ගෙන සසර ගමන නිර්මාණය වන ආකාරය පටිච්චසමුප්පාද දේශනාව තුළින් ඉදිරිපත් කොට තිබේ. මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇති පටිච්චසමුප්පාද දේශනාව සදාකල්හි පවතින ධර්මතාවයකි. ලෝකයෙහි තථාගතවරු උපන්නේ ද නූපන්නේ ද ධර්මයන්ගේ නියමයක් වූ පටිච්චසමුප්පාදය ලොව පවතින්නකි. බුදුවරු එය අවබෝධ කොට ගෙන මෙය මා හට දේශනා කරති.

**"කතමෝච භික්ඛවේ පටිච්චසමුප්පාදෝ උප්පාදෝවා තථාගතා, අනුප්පාදෝවා තථාගතා ඨිතාව සාධාතු ධම්මතා ධම්ම නියාමතා ඉදිප්පච්චයතා"**[5]

සදාතනික ධර්මතාවක් වූ පටිච්චසමුප්පාද ධර්මය යමෙක් අවබෝධ කරන්නේ ද, හෙතෙම බුදුරජාණන් වහන්සේ දකින බවත් යමෙක් බුදුරජාණන් වහන්සේ දකින්නේ ද හෙතෙම පටිච්චසමුප්පාද ධර්මය දකින බවත් දේශනාවේ සඳහන් වේ.[6] පටිච්චසමුප්පාද දේශනාවෙහි මූලික අභිප්‍රාය වනුයේ සත්වයා සසර දුකින් එතෙර කිරීමයි. ඒ අනුව පටිච්චසමුප්පාද දේශනාව තුලින් දුක්ඛ සම්භවයත් එහි ප්‍රහාණයත් අවබෝධ කිරීමට සත්වයා යොමු කිරීම මූලික අපේක්ෂාවයි. පටිච්චසමුප්පාද දේශනාවෙහි මූලධර්ම අවස්ථාව මෙසේ ඉදිරිපත් කළ හැකිය.

**ඉමස්මිං සති ඉදං හෝති**
**ඉමස්මිං අසති ඉදං න හෝති**
**ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**
**ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති**

මෙය ඇති කල්හි මෙය ඇති වේ. මෙය ඇති කල්හි මෙය නොවේ. මෙය උපදීමෙන් මෙය උපදී. මෙය නැති කිරීම තුල මෙය නැතිවේ යන්න මෙහි අර්ථයයි. මෙය පටිච්චසමුප්පාදයෙහි කෙටි සූත්‍රය වශයෙන්ද හඳුන්වනු ලැබේ. මෙහි විවිධ පරියායන් විවිධ සූත්‍රානුගතව පවතී. පටිච්චසමුප්පාද ධර්මයෙහි සංඛ්‍යා වශයෙන්ද විවිධත්වයක් බොහෝ සූත්‍රයන් තුළ දැකගත හැකිය. සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයෙහි පටිච්චසමුප්පාදයෙහි අංග 11 ක් පමණක් දක්නට ලැබේ. මහා නිධාන සූත්‍රයේ දක්නට ඇත්තේ අංග 10 කි. සංයුක්ත නිකායේ උපනිසා සූත්‍රයෙහි අංග 22 ක් දක්නට ලැබේ. මෙම විවිධත්වය පටිච්චසමුප්පාද ධර්මය ඇතුලත් සූත්‍රයන් තුළ දැකගත හැකිය. මෙම විවිධත්වය හේතු කොට ගෙන භාරතීය බෞද්ධ ඉතිහාසය පුරාම විවිධ දර්ශනවාද බිහිවීම විමතියට කරුණක් නොවේ.

මේ අනුව බුදු සමය විසින් සත්වයා හා ලෝකය විවරණය කරනු ලබන්නේ පටිච්චසමුප්පන්න ස්ඛන්ධ පංචකය ආයතන දොළොස, ධාතු අටළොසක සන්තති සාමාග්‍රිකයන් වශයෙනි.



සංසාරගත සත්වයා යනු පටිච්චසමුප්පන්න ධර්ම දොළොස පැවැත්මකි. මේ පටිච්චසමුප්පන්න ධර්මයන් ආත්ම වශයෙන් සාර වශයෙන් ගැනීම නියතයෙන්ම සාවද්‍ය හා විපරීත වූ ග්‍රහණයකි. මෙය වටහා නොගැනීම අවිද්‍යාවයි. මේ අවිද්‍යාව ප්‍රත්‍ය කොට ජාති, ජරා, මරණ ආදී සියලු දුක් රැස හට ගනී. මේ දුක් රැසෙන් මිදෙන මග තථාගතයන් වහන්සේ විසින් දේශනා කරනු ලබන අතර ඒ මග ගොස් අපගේ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් යථාභූත සත්‍ය අවබෝධ කොට දුකෙන් මිදීම අපට අයත් කාර්යයක් වශයෙන් දක්වයි.[7]

බුද්ධ ධර්මයේ එන සියලුම දේශනා පටිච්චසමුප්පදායේ එන කරුණු අනුව ඉදිරිපත් කොට ඇති බව පෙනේ. අනිත්‍යතා, දුක්ඛතා, අනාත්මතා, ශූන්‍යතා යනාදී මූලධර්මයන්ට පදනම වූයේ පටිච්චසමුප්පාද ධර්මයයි. සියලුම නාම රූප ධර්මයන් සාපේක්ෂකව හෙවත් පටිච්චසමුප්පන්නව පවතී. ස්වාධීනව හට ගන්නා කිසිවක් විශ්වයෙහි කොතනකවත් නොමැති බව බුදු සමය අවධාරණය කරයි. හඳුනා ගැනීමේ පහසුව පිණිස එම ධර්මයන් වෙන් කොට ගන්නා නමුදු යථාර්ථයක් වශයෙන් ගත් කළ ඒවා එකිනෙකට සාපේක්ෂකව හෙවත් පටිච්චසමුප්පන්නව පවතින්නකි. මෙසේ හේතුප්‍රත්‍යන්ගෙන් හට ගන්නා සියල්ල විනාශයට පත් වන බව බුදුසමයේ ඉගැන්වීමයි. **(යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං)** විශ්වයේ ඇතිවන හා නැතිවන සියල්ලම පටිච්චසමුප්පන්නව සිදුවන බව මෙහි අර්ථයයි.[8]

බුදුදහම තුළ ඉදිරිපත් කොට ඇති පටිච්චසමුප්පාද ධර්මය විවිධ නයින් ඉදිරිපත් කරනු වස්, නාගර්ජුන පාදයන් විසින් පටිච්චසමුප්පාද ධර්මය පදනම් කොට ගනිමින් මාධ්‍යමික දර්ශනය බිහි කිරීමෙහිලා උත්සුක වූ ආකාරයක් දක්නට ලැබේ. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද පටිච්චසමුප්පාද ධර්මය පදනම් කොට ගනිමින්ම මධ්‍යමක දර්ශනයෙහි පටිච්චසමුප්පාද ධර්මය ඉදිරිපත් කොට තිබේ. බුදුසමය තුළ පුද්ගල නෛරාත්මය හා ධර්ම නෛරාත්මය දුරු කිරීම සඳහා පටිච්චසමුප්පාද දේශනාව උපයෝගී කොට ගත් අතර, නාගර්ජුන පාදයන් ඇතුළු මාධ්‍යමික සම්ප්‍රදායට අයත් ආර්ය වරුන් විසින් පටිච්චසමුප්පාද දේශනාව විවිධ නයින් උපයෝගී කොට ගෙන මධ්‍යමක දර්ශනයේ මූලික සංකල්ප ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව මධ්‍යමක දර්ශනයෙහි වර්ධනය කෙරෙහි මුල් බුදුසමයේ පටිච්චසමුප්පාද දේශනාව ඉවහල් වී ඇති ආකාරය දක්නට

ලැබේ. මධ්‍යමකයන් විසින් සිය දාර්ශනික සිද්ධාන්තයන් පැහැදිලි කිරීම කරන ලද්දේ මෙකී පටිච්චසමුප්පාද ධර්මය සියුම් ලෙස අධ්‍යනය කරමින් විවිධ සංකල්ප ඉදිරිපත් කිරීමෙනි. ඔවුහු නිබඳවම පටිච්චසමුප්පාද ධර්මය සිහිපත් කරති. සංසාරය, දුක කර්මය වැනි සංකල්ප පැහැදිලි කරනු වස් මුල් පටිචසමුප්පාද දේශනාව උපයෝගි කොට ගන්නා ලදී.

බුදුරජාණන් වහන්සේ දහම් දෙසන විට ඇත යන අන්තය හෙවත් ශාවස්වතවාදී අන්තය සහ නැත හෙවත් ආශාස්වතවාදී අන්තය යන අන්තද්වය පසෙකින් තබා මධ්‍යස්ථව පටිච්චසමුප්පාද දහම් දේශනා කළහ. ඒ අනුව මාධ්‍යමිකයන් විසින් ද නිරතුරුවම සියලු දෘෂ්ටීන් ප්‍රහාණය කිරීම කරනු ලැබුයේ පටිච්චසමුප්පාද අනුව හෙවත් මධ්‍යම ප්‍රතිපදාව අනුවයි. ඒ අනුව නාගර්ජුන පාදයන් විසින් මූලමධ්‍යමික කාරිකා ආරම්භයේදීම 'ලොව ශ්‍රේෂ්ඨ වූ යම් බුදුවරයෙක් නිරෝධය හා උත්පාදය නැති උච්ඡේද හා ශාස්වතද නැති භින්නාර්ථ ද, අභින්නාර්ථ ද, නොවූ ආගමයක් හෝ නිර්ගමයක් නැති ප්‍රපංචයක් උපසමනය කරන උපද්‍රවය රහිත හෙයින් ශිව වූ පටිච්චසමුප්පාදය දේශනා කළේද උන්වහන්සේට වදිමි.[9] යනුවෙන් බුදුරජාණන් වහන්සේට නමස්කා කරමින් ග්‍රන්ථය ආරම්භ කොට තිබේ. මේ ආකාරයට මාධ්‍යමික කාරිකාව ආරම්භ කොට ඇතත් සමස්ථයක් වශයෙන් සැළකීමේ දී පෙනීයන තවත් කරුණක් වනුයේ බුද්ධ දේශිත පටිච්චසමුප්පාද වඩාත් ගැඹුරින් හා වඩාත් පුළුල්ව ඉතා සියුම් ලෙස හදාරමින් ඊට අනුගතව බිහි වූ දාර්ශනික සම්ප්‍රදායක් වශයෙන් මාධ්‍යමික දර්ශණය බිහි වී ඇති බවයි.

මුල් බුදුසමයෙහි සඳහන් කරන ආකාරයට යමෙක් පටිච්චසමුප්පාද දකී ද හෙතෙම ධර්මය දකී. යමෙක් ධර්මය දකී ද හෙතෙම පටිච්චසමුප්පාද දකින බව මජ්ඣම නිකායේ සඳහන් වී තිබේ. ඒ අනුව මධ්‍යමිකයන් විත් මෙසේ තම දර්ශනයේ මූලික පදනම වශයෙන් ඉදිරිපත් කරන්නට යෙදුනේ බුදු සමයේ ඉදිරිපත් කොට ඇති පටිච්චසමුප්පාද දේශනාවයි. ඒ අනුව මාධ්‍යමිකයන් ඔවුන්ගේ පටිච්චසමුප්පාද ඉදිරිපත් කරනු ලබන්නේ මෙවැනි අයුරිනි. 'යමක් පටිච්චසමුප්පාදවේද, ඒ ශූන්‍යතාවයි කියමු. එය උත්පාදය ප්‍රඥප්තිය හෙවත් සාපේක්ෂතාවයි. එය මධ්‍යම ප්‍රතිපදාවයි' යනුවෙන් මූල මාධ්‍යමික කාරිකාවේ මෙසේ සඳහන් වේ.



**"යඃ ප්‍රතීත්‍යසමුත්පාදඃ - ශුන්‍යතාං තං ප්‍රචක්ෂ්මහේ**
**සා ප්‍රඥප්තිරුපාදාය - ප්‍රතිපත්සෛව මධ්‍යමා"**

මාධ්‍යමිකයන් විසින් පටිච්චසමුප්පාද දේශනාව ඉදිරිපත් කළ ආකාරය පිළිබඳ මොරටුවේ සාසනරතන හිමියෝ මෙසේ ඉදිරිපත් කරති.

**"ප්‍රතීත්‍ය සමුප්පාදායෙන් උගන්වන පරිණාමවාදය යථා විධියෙන් විග්‍රහ කළේ මාධ්‍යමිකයන් විසිනි. මාධ්‍යමිකයන් ශූන්‍යතාව නමින් හඳුන්වන පරිණාමවාදය බෞද්ධ දෘෂ්ටි කොණයෙන් බලා කළ විග්‍රයයි. මෙතැනදී එක් කරුණක් සිහිපත් කළ යුතුව ඇත. එනම් ස්ථවීරවාදීහු පටිච්චසමුප්පාදය සත්වයා පමණක් විග්‍රහ කිරීමට යොදා ගත් ෂත්ව පරිනාම දර්ශනයක් මෙන් සලකති. එහෙත් මාධ්‍යමිකයේ ඒ පටිච්චසමුප්පාදයම හේතුඵලවාද සහ ශූන්‍යතා නාමයෙන් ගෙන ද්‍රව්‍ය ලෝක සහ ජීව ලෝකයේ පරිණාමය දක්වති."[10]**

මෙයින් පැහැදිලි වන කරුණක් වනුයේ පටිච්චසමුප්පාද දේශනාව සත්ව පරිණාමය හෝ ද්‍රව්‍ය පරිණාමය පමණක් ඉදිරිපත් කරන දහමක් මෙන් නොව විශ්වයේ ආරම්භය හා අවසානය දක්වා විස්තර කරන දහමක් වශයෙන් හඳුන්වා තිබීමයි. විශ්වයේ ආරම්භය හා අවසානය සම්බන්ධයෙන් විවිධ විචාර හා සංකල්ප ඉදිරිපත්ව ඇතත් ඒ සියල්ල ඊශ්වර නිර්මාණවාදීව ඉදිරිපත් කොට තිබේ. එහෙත් ලෝකයේ සිදුවීම් පටිච්චසමුප්පාදය අනුව විස්තර කිරීම බුදුදහම අනුගමනය කළ ප්‍රතිපත්තියක් විය. ඒ නිසා සියලුම සාමාජීය සිද්ධීන් බුදුදහමට අනුව හේතු ප්‍රත්‍ය රැසක් නිසා එසේ සිදුවන බව දක්වා තිබේ. ඒ අනුව ලෝකයේ ආරම්භය මෙන්ම විනාශය ද දෙවියෙකුගේ ක්‍රියාවක් නොවන බව ඔප්පු කළහ. සියල්ල පටිච්චසමුප්පාදය අනුව සිදුවන බව ප්‍රකාශ කළහ.

දීඝ නිකායේ මහා නිදාන සූත්‍රය තුළ මෙම පටිච්චසමුප්පාද න්‍යාය යොදා ගෙන ඇත්තේ සමාජ යථාර්ථය ප්‍රකට කරුනු පිණිසය. මිනිසා තම සංවේදනයන් ප්‍රත්‍යකොට ගෙන පහල කර ගන්නා තෘෂ්ණාව නිසා විවිධාකාරයෙන් ලෞකික වූ දේ සෙවීමට යොමුවෙයි. **(වේදනං පටිච්ච තණ්හා)** මෙසේ සොයන්නේ විවිධ ලෞකික දේ ලබා ගනියි. (තණ්හං පටිච්ච පරියේසනා) අනතුරුව එසේ ලබා ගන්නා දේ

02 OCT 2015

විනිශ්චයට හෙවත් තක්සේරුවට භාජනය කරනු ලැබයි. **(ලාභං පටිච්ච විනිච්ඡයෝ)** මෙම විනිශ්චය නිසා එම ලෞකික දේ පිළිබඳ ඡන්දරාගය උපදී. **(විනිච්ඡයං පටිච්ච ඡන්දරාගෝ)** එකී ඡන්දරාගය නිසා අයත් කර ගැනීම වේ. **(ඡන්දරාගං පටිච්ච පරිග්ගහෝ)** අයත් කර ගැනීම නිසා මසුරු බව වේ. **(පරිග්ගහං පටිච්ච මච්ඡරියං)** මසුරු බව නිසා ආරක්ෂාව වේ. **(මච්ඡරියං පටිච්ච ආරක්ඛෝ)** මේ ආරක්ෂක විධිවිදාන නිසා දඬු ගැනීම, අවි ගැනීම කළහ. විවාද එකිනෙකාට චෝදනා කිරීම, කේලම් මුසාබස් ආදී නොයෙකුත් පාප අකුසල ධර්මයෝ හට ගත්හ. මෙසේ මහා නිදාන සූත්‍රය පටිච්චසමුප්පාදය භාවිතා කරන්නේ සමාජයේ විවිධ අකුසල ධර්මයන් ඇතිවන ආකාරය පෙන්වා දීමටය. එහි ප්‍රතිලෝම ප්‍රත්‍යාකාරය ද එම සූත්‍රයෙහි දක්වා තිබේ.[11]

මේ අනුව යමින් මාධ්‍යමිකයන් සිය මූලික සංකල්ප හඳුන්වාදීමේ දී පටිච්චසමුප්පාදය යොදා ගත් අතර, බුදුසමය සැම විටම අන්තවාදී නොවී කරුණු ඉදිරිපත් කළාක් මෙන්ම මාධ්‍යමිකයන් ද අන්තවාදී නොවූහ. ද්විකොටි, චතුෂ්කොටි බුදු සමය ප්‍රතික්ෂේප කළාක් මෙන්ම, මාධ්‍යමිකයන් මේ අන්තවාදයන් ප්‍රතික්ෂේප කරනු ලැබීය. අචේලකස්සප සූත්‍රයෙහිලා බුදුරදුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද අබෞද්ධ හේතුඵලවාද සතරම මාධ්‍යමිකයන් විසින් ද ප්‍රතික්ෂේප කරන ලදී. හේතුඵල චින්තනය අප නොමග යවයි. ස්වයංකත වාදය විවේචනය කරන ආචාර්ය නාගර්ජුන පාදයන් හේතුඵල අනන්‍යයැයි නොපිළිගනියි. ඵලය ඵලයෙන්ම උපදිය නොහැක. හේතුව තුළ ඵල අන්තර්ගත නම් අමුතුවෙන් ඵල ඉපදීමක් ගැන කථා කිරීමේ තේරුමක් ද නැත. හේතුඵල අනන්‍යයැයි සැලකීම අබෞද්ධ අන්තයකි. එය ශාස්වත දෘෂ්ටියට තුඩු දෙයි. හේතුව තුළ ඵලය පිහිටියේ නම් අලුතින් හට ගත් කිසිවක් නැත. හේතුඵල අනන්‍ය නම් දෙකක් ලෙස සැලකීමේ තේරුමක්ද නැතැයි නාගාර්ජුන පාදයෝ පෙන්වා දෙති. මෙලෙසින් පරංකතවාද (පරතඃ උත්පාදවාදය) ප්‍රතික්ෂේප කරනු ලැබේ. හේතුවත් ඵලයත් දෙකක් නම් හේතුවට වඩා වෙනස් වූවක් ඵලය ලෙස සැලකිය යුතු නොවේදැයි නාගර්ජුන අසයි. එවිට හේතුව හා ඵලය අතර සම්බන්ධයක් නැතිව අනෙක් හේතුවකින් අනෙක් සම්බන්ධයක් නැතිව ඵලයක් ඉපදිය යුතුය. හේතු ඵල දෙක අන්‍යතර යන මේ වාදය උච්ඡේද දෘෂ්ටියට තුඩු දෙයි. උභයතාවාදයම නාගර්ජුන ප්‍රතික්ෂේප කරයි.[12] ඒ අනුව මාධ්‍යමිකයන් ශාස්වතවාදයත් අශාස්වතවාදයත්



ප්‍රතික්ෂේප කරමින් ඒ වෙනුවට පටිච්චසමුප්පන්නව කරුණු ඉදිරිපත් කරන බව පෙන්වා දී තිබේ.

**"අස්තීති ශාශ්වතග්‍රාහෝ - නාස්තීත්‍යුච්ඡේද දර්ශනං**
**තස්මා දස්තීත්වනාස්තිව - නාශ්‍රියේත විචක්ෂණඃ"[13]**

මාධ්‍යමිකයන් විසින් ඉදිරිපත් කරන ලද පටිච්චසමුප්පාදය එක් අර්ථයකින් ඉදිරිපත් කිරීමට නොහැක. මන්දයත් මාධ්‍යමිකයන් විසින් මෙය මුල්කර ගනිමින් විවිධ න්‍යායන් තම දර්ශනයට ඇතුලත් කොට ඇති හෙයිනි.[14] ඒ අනුව ශූන්‍යතාව, මධ්‍යමප්‍රතිපදාව, සාපේක්ෂතා සංකල්ප බිහි කර ගැනීමෙහි ලා පටිච්චසමුප්පදාය න්‍යාය භාවිතා කොට ඇත. ඔවුන්ට අනුව ලෝකයේ ඉහත සංකල්ප වලට යටත් නොවූ කිසිවක් නොමැති බව ඉදිරිපත් කරයි. අහේතුක වූ අප්‍රත්‍යය වූ කිසිවක් ලෝකයේ කිසිඳු තැනක නොමැති බව ඔවුනගේ මතයයි.

**"අප්‍රතීත්‍ය සමුප්පන්නෝ - ධර්මඃ කශ්චින්න විද්‍යතේ**
**යස්මාත් තස්මාද් ශූන්‍යොහි - ධර්මඃ කශ්චින්න විද්‍යාතේ"[15]**

මාධ්‍යමිකයන් විසින් සියල්ල පටිච්ච සමුප්පන්නව ඇතිවන ආකාරය ඉදිරිපත් කිරීමේදී ජීවිතයේ ඇති වන දුක සතුට පවා පටිච්චසමුප්පන්නව ඇති වන ආකාරය ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන තිබේ. බෞද්ධ දර්ශනය තුළ දුක හට ගන්නා ආකාරය, එය නැති කිරීම, නැති කිරීමේ මාර්ග ආදී වශයෙන් චතුරාර්ය සත්‍ය දේශනා කළ අතර මාධ්‍යමිකයන් විසින් ද නිරතුරුවම ඉදිරිපත් කොට තිබෙන්නේ දුක ඇති වන්නේ කිසියම් හේතු කාරණාවක් පසුබිම් කර ගෙන බවයි. හේතුප්‍රත්‍යයන්ගෙන් හට නොගන්නේ නම් දුකක් හට ගන්නේ කෙසේ ද අනිත්‍ය දේ දුක වේ. යමක් අනිත්‍ය නොවන කල්හි එහි දුකෙහි හට ගැනීමක් කොහිද යන්න මාධ්‍යමිකයන්ගේ ඉදිරිපත් කිරීමයි.

**"අප්‍රතීත්‍ය සමුප්පන්නෝ - කුතෝ දුඃක්ඛං භවිෂ්‍යති**
**අනිත්‍ය මුක්තං දුඃක්ඛංහි - තත්ස්වාභාවෝන විද්‍යතේ"[16]**

බෞද්ධ දර්ශනය තුල දේශනා කරනු ලබන්නේ කිසිවක් පටිච්චසමුප්පන්නව හට නොගන්නා බවයි. ඒ අනුව සියල්ල

එකිනෙකට සාපේක්ෂකව හට ගන්නා බවයි. මේ කරුණ බුදුරජාණන් වහන්සේ විසින් මජ්ඣිම නිකායේ දී සාති භික්ෂුවට ප්‍රකාශ කරයි.

"අනේක පරියායේන අවුසෝ සාති පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා අඤ්ඤත්‍ර පච්චයා විඤ්ඤාණස්ස සම්භවෝ"[17]

ඒ අනුව අනේක පරියායෙන් පටිච්චසමුප්පාදව විඤ්ඤාණය දේශනා කරන ලද බවත්, හේතුප්‍රත්‍යකින් තොරව විඤ්ඤාණයෙහි හට ගැනීමක් නොහැකි බවත් දේශනා කොට තිබේ. බුදුදහම අනුව මෙසේ හේතුප්‍රත්‍ය ධර්මතාව අවබෝධ කිරීම යනු චතුරාර්ය සත්‍යාවබෝධ කිරීමයි. මේ කරුණ අර්ය නාගර්ජුන පාදයන් විසින් ඉදිරිපත් කොට තිබේ. බුදුදහමේ ඉගැන්වෙන "යෝ ධම්මං පස්සති සෝ පටිච්චසමුප්පන්නං පස්සති" යන දහම් පාඨයට සමානවම මාධ්‍යමික අදහස ද ඉදිරිපත් කොට තිබේ.

**යඃ ප්‍රතීත්‍ය සමුත්පාදං - පශ්‍යතීදං සපශ්‍යති**
**දුඃක්ඛං සමුදයං චෛව - නිරෝධං මර්ග මේවච**[18]

යමෙක් සියලු ධර්මයන්හි පටිච්චසමුප්පාදය දකී ද, එම පුද්ගල තෙමේ චතුරාර්යය සත්‍ය දේශනාව මැනවින් අවබෝධ කර ගන්නා බව මූල මාධ්‍යමික කාරිකාවේ ඉදිරිපත් කරයි. මේ අයුරින් විමසීමේ දී මාධ්‍යමිකයන් විසින් පටිච්චසමුප්පාද දේශනාව තම දර්ශනයට මැනවින් සම්බන්ධ කළ ආකාරය දක්නට ලැබේ. පටිච්චසමුප්පාද දේශනාවේ එන මූලික කරුණු සියල්ලක්ම මෙහිදී නාගර්ජුන පාදයන් විසින් විවිධ නයින් ඉදිරිපත් කිරීමට උත්සාහ ගත් ආකාරය දිස්වේ. එනම් බුදු දහමේ පටිච්චසමුප්පාද දේශනාව ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කිරීමක් නොවේ. බුදුදහම තුළ චක්ඛු විඤ්ඤාණය ඇතිවන ආකාරය හේතුප්‍රත්‍ය සහිතව ඉදිරිපත් කරන ලදී,



**"චක්ඛුං පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"**[19]

චක්ඛු විඤ්ඤාණය ඇති වන්නේ ඇස රූපය විඤ්ඤාණය හා එකිනෙකට ප්‍රත්‍ය වූ විටය යන මෙම කරුණ මාධ්‍යමිකයන් විසින්ද සාකච්ඡා කොට තිබේ.

**"උත්පද්‍යතේ ප්‍රතිත්‍යමාතීතිමෙප්‍රත්‍යයාඃ කිල**
**යාවන්නොත් පද්‍යතේ ඉමෙ - තාවන්න ප්‍රත්‍යයාඃ කථම්**[20]

ඇස ආදී ප්‍රත්‍යයන් හේතුකොට ගෙන විඤ්ඤාණය උපදී යම්තාක් ඒ විඤ්ඤාණය නූපදී ද, එතෙක් චක්ෂුරාදීහු කෙසේ නම් ප්‍රත්‍යයයෝ වෙත්ද යනුවෙන් එම කරුණ ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව මාධ්‍යමික දර්ශනය තුළ මූලික ඉගැන්වීමක් වන පටිච්චසමුප්පාද සංකල්පය මුල් බුදු දහමේ ඉදිරිපත් කොට ඇති පටිච්චසමුප්පාද දේශනය මුල් කොට ගනිමින් හෙවත් ආභාසය ලබා ගනිමින් ඉදිරිපත් වී ඇති ආකාරය පැහැදිලි වේ.

## ආන්තික සටහන්

01. මහාවග්ග පාලිය I (මහාක්ඛන්ධක) පි.86, බු.ජ.ත්‍රි.
02. ම.නි, අරිය පරියේසණ සූත්‍රය, පි488, බු.ජ.ත්‍රි.
03. සං.නි II, නිදාන සූත්‍රය, පි.144, බු.ජ.ත්‍රි.
04. ම.නි. I, මහා යමක වග්ගය, මහා තණ්හාසංඛ සූත්‍රය, පි.612, බු.ජ.ත්‍රි.
05. සං.නි, පච්චය සූත්‍රය, පි.40, බු.ජ.ත්‍රි.
06. ම.නි. I,මහා හත්ථිපදොපම සූත්‍රය, පි, 460, බු.ජ.ත්‍රි.
07. සිරිසීවලී හිමි බඹරැන්දේ, විදූලකර ප්‍රඥාසාර ප්‍රශස්ති, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ප්‍රකාශන, 1996, පි.316
08. රාහුල හිමි රත්නපුරේ, බුදු සමයේ උදාව, කර්තෘ ප්‍රකාශන, 1995, පි.120
09. සාසන රතන හිමි මොරටුවේ, මූ.මා.ක. 24-XVIII ගාථාව, පී.ජේ.රුද්‍රිගෝ ප්‍රකාශන, 1963
10. සාසන රතන හිමි මොරටුවේ,මාධ්‍යමික දර්ශනය, අතුල ප්‍රකාශන, 1970, පි.75
11. මේධානන්ද හිමි දේවාලේගම, බෞද්ධ අධ්‍යන ප්‍රවේශය, කර්තෘ ප්‍රකාශන, 1997, පි.89
12. මේධානන්ද හිමි දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රධාය, අරිය ප්‍රකාශන, 1989, පි.84

13. සාසන රතන හිමි මොරටුවේ, මූ.මා.කා. 15-XX ගාථාව, පී.ජේ.රුද්‍රිගෝ ප්‍රකාශන,
1963
14. Singh, Jaidev, (1968) And Introduction to madhyamaka philosophy, motilal
banuidass, p.23
15. සාසන රතන හිමි මොරටුවේ, මූ.මා.කා. 24-XIX ගාථාව, පී.ජේ. රුද්‍රිගෝ ප්‍රකාශන,
1963
16. සාසන රතන හිමි මොරටුවේ, මූ.මා.කා. 24-XXI ගාථාව, පී.ජේ.රුද්‍රිගෝ ප්‍රකාශන,
1963
17. ම.නි, I 'අරියපරියේසණ සූත්‍රය', පි.256,257, බු.ජ.ත්‍රි.
18. සාසන රතන හිමි මොරටුවේ, මූ.මා.කා. 24-XVIII ගාථාව, පී.ජේ.රුද්‍රිගෝ ප්‍රකාශන,
1963
19. තිලකරත්න අසංග, අභිධර්ම අධ්‍යනය, කර්තෘ ප්‍රකාශන, 1995, පි.173
20. සාසන රතන හිමි මොරටුවේ, මූ.මා.කා. I-V ගාථාව, පී.ජේ.රුද්‍රිගෝ ප්‍රකාශන, 1963